**බද්දේගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බැලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.2,585,613 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල ගිණුම්ගත කළ යුතු වේ. | නිශ්චිත තොරතුරු ලබා ගැනීමෙන් පසු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | වටිනාකම රු.13,790,077 ක් වූ ස්ථාවර වත්කම් 64 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | සමීක්ෂණයක් පවත්වා තොරතුරු ලබාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ උපකරණ මිලදී ගැනීම් 03 කදී සහ ඉදිකිරීම් හා සංවර්ධන අවස්ථා 04 කදී වැය වූ එකතුව රු.332,957 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සභාවට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් දෙදෙනෙකු ලබාගෙන තිබුණ රු.260,820 ක් වූ අත්තිකාරම් ණය ශේෂය මුද්දර ගාස්තු ආදායම්වලින් හිලව් කර තිබුණ ද, සභාව අදාළ පරිදි ගිණුම් ගලපා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) **නොසැසඳූ පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.68,651,798 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.154,781,302 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | | |
| (i) | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |
| (ii) | රීති 217 හා 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණු අතර, අංක පී.එස්. 46 දරන ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් ද පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 හා 1646 | වාහන 06 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් පනත | මාසික දායක මුදල් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් රු.29,107 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වගකිවයුතු නිලධාරීන් ගෙන් අය කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.21,803,318 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.21,358,068 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,733,661 | 3,320,053 | 1,355,819 | 1,964,234 | 2,755,436 | 3,039,858 | 1,101,939 | 1,937,919 |
| කුලී | 1,179,100 | 3,008,795 | 2,921,820 | 86,975 | 1,179,100 | 1,975,610 | 1,862,635 | 112,975 |
| බලපත්‍ර ගාස්තු | 1,175,000 | 1,369,680 | 1,364,930 | 4,750 | 1,204,000 | 1,279,600 | 1,273,760 | 6,000 |
| | 5,087,761 | 7,698,528 | 5,642,569 | 2,055,959 | 5,138,536 | 6,295,068 | 4,238,334 | 2,056,894 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.5,087,761 ක් වූ අතර, බිල් කළ ආදායම රු.7,698,528 ක් විය. බිල් කළ ආදායමින් රැස් කළ ආදායම රු.5,642,569 ක් හෙවත් සියයට 73 ක් විය. | නිවැරදිව ඇස්තමේන්තු සැකසීමට හා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු ආදායම රු.1,960,244 ක ඉහළ අගයක් ගෙන තිබූ නමුත්, දේපල තහනම් කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 බදු කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික බදු කුලී ඇස්තමේන්තුව රු.1,179,100 ක් හා බිල් කිරීම් රු.3,008,795 ක් වූයෙන්, ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු.1,829,695 ක් වැඩියෙන් බිල්කිරීම් කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායම නිවැරදි ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු සැකසීමට හා බිල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.2,274,093 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.76,055,373 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මාකුරුගොඩවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකර තිබූ ඉඩමේ භුක්තිය සභාවට පවරා දී තිබුණ ද, අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩමේ අයිතිය සභාව වෙත පවරා ගෙන විධිමත් පරිදි කසළ කළමනාකරණය සිදු කිරීමට කටයුතු කරමි. |
| (ii) | සභාව විසින් කසළ බැහැර කිරීම හා කාබනික පොහොර නිෂ්පාදන වැඩබිම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු වේ. | ඉදිරියේ දී පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

#### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **වීඪී පහන් නඩත්තුව** | | | |
| (අ) | සභාව සමාලෝචිත වර්ෂය සඳහා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම නිසා වර්ෂයට අදාළ අයවිය යුතු වීඪී පහන් ප්‍රතිපූර්ණ මුදල් විදුලිබල මණ්ඩලයෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී අනුමත කරගත් වීඪී පහන් සඳහා මුදල් ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. | 2019 වර්ෂයේ දි විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතව වීඪී පහන් ගාස්තු ප්‍රතිපූර්ණය කර ගනිමි. |
| (ආ) | සභාවෙන් නඩත්තු වන වීඪී පහන් ප්‍රමාණය සම්බන්ධ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, අළුතෙන් වීඪී පහන් සවි කිරීමේ දී ලංකා විදුලිබල මණ්ඩලයෙන් අනුමැතිය ගැනීමක් සිදුකර නොතිබුණි. | වීඪී පහන් ලේඛනයක් පවත්වා ගතයුතු වේ. | වීඪී පහන් ලේඛනයක් පවත්වා ගැනීමත්, අළුතෙන් සවිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අතිරික්ත සේවක සංඛ්‍යාව 15 ක් ද, පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් ද විය. | පුරප්පාඩු තනතුරු සඳහා විධිමත්ව බඳවා ගැනීම් කිරීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සඳහා අනුමැතියට යවා ඇත. |
| (ආ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25/2014 ට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගත් අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් 13 දෙනෙකු වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.3,114,331 ක් වැයකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ. 71 යටතේ ඉදිරියේ දී විධිමත් කිරීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### (අ) කඩ කාමර පවත්වාගෙන යාම සහ බදු අය කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වඳුරඹ බස් නැවතුම්පොල ඉදිරිපිට අංක 03, 04 හා 08 දරන කඩ කාමර සමාලෝචිත වර්ෂය තුළ වසාදමා තිබුණි. | කඩ කාමර අළුත්වැඩියා කර, ගිවිසුම්ගතව බදු දීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදිව ආදායම් ඉපයීමට කටයුතු කරමි. |
| (ii) | වඳුරඹ මාපලගම පාර සතිපොල භූමියෙහි අංක 2, 3, 4, 5, 6 හා 8 දරන කඩ කාමර 2013 අප්‍රේල් 24 දින සිටම බදු දීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර අළුත්වැඩියා කර, ගිවිසුම්ගතව බදු දීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදිව ආදායම් ඉපයීමට කටයුතු කරමි. |
| (iii) | 2003 වර්ෂයේ සිට බදු ගිවිසුමකින් තොරව ලංකා ධීවර සංස්ථාවට බදු දී තිබුණු මාළු වෙළඳසැල සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට වසා දමා තිබුණි. එකී වෙළඳසැල සමාලෝචිත වර්ෂයේ මැයි 31 දින නැවත සභාවට පවරාගෙන තිබුණ ද, අයවිය යුතු හිඟ බදු කුලිය වූ රු.652,723 ක් අයකර ගෙන නොතිබුණි. | කඩ කාමරය ගිවිසුම්ගතව බදු දීමට ද හිඟ බදු මුදල් අයකර ගැනීමට ද කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදිව ආදායම් ඉපයීමට කටයුතු කරමි. |

### (ආ) ඉදිගස්කැටිය මුඩුක්කු සංහාර නිවාස

| | | | |
|---|---|---|---|
| (i) | මාසික කුලී පදනම මත බදු දී තිබූ නිවාස 07 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ බදු කුලිය රු.99,486 ක් වූ අතර, 2019 පෙබරවාරි 25 දිනට තවදුරටත් රු.67,486 ක් හිඟව පැවතුණි. | හිඟ බදුකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | මාසික කුලිය රුපියල් සියයට නොවැඩි නිවාස කුලී නිවැසියන්ට නාමික අගයකට පවරා දීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් 2017 වර්ෂයේ දී තොරතුරු විමසා තිබුණ ද, මෙතෙක් එම නිවාස පවරා දී නොතිබුණි. | නිවාස පවරා දීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස් විමසුම් කර ඇති තොරතුරු ලබාදීමට කටයුතු කරමි. |
| (iii) | මුඩුක්කු සංහාර නිවාස අංක 04 හි අයිතිය පිළිබඳ ගැටළු මතු වී තිබූ බැවින් සභාව විසින් නිවාස කුලී අයකිරීම් නතර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මැයි මස සිට මාසික කුලී අය කර නොතිබුණි. | නිවාස කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ගැටළු නිරාකරණය කර කඩිනමින් හිඟ මුදල් සමඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ දී සභාවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී කටයුතු කරමි. |

#### 3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2014 වර්ෂයේ දී මිලදී ගත් රු.75,710 ක් වටිනා ටයර් 05 ක් 2019 පෙබරවාරි 25 විගණන දිනය වන විටත් ගබඩාව තුළ නිෂ්කාර්යයව පැවතුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් කටයුතු සිදුකළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | විවිධ වර්ගයේ ටයර් 22 ක් 2014 වර්ෂයේ දී රු.181,935 ක වියදමක් දරා නැවත පුරවා (ඩැග් කර) තිබුණ ද, භාවිතයට ගැනීමකින් තොරව 2019 පෙබරවාරි 25 දින වනවිටත් නිෂ්කාර්යයව පැවතුණි. | ප්‍රයෝජනයට ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | ට්‍රැක්ටර් ටේලරයක් අළුත්වැඩියා කිරීම සඳහා 2016 ජුනි 02 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් වාර්තාවක් ලබා දී තිබුණ ද, එම ටේලරය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීම කඩිනමින් සිදුකළ යුතු වේ. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරමි. |
| (ඇ) | වීපී පහන් ට්‍රැක්ටරය 2016 වර්ෂයේ සිට වීපී පහන් අළුත්වැඩියා කටයුතු සඳහා යොදා නොගෙන ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ | අළුත්වැඩියා කිරීම කඩිනමින් සිදුකළ යුතු වේ. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරමි. |

නිෂ්කාර්යයව පැවතුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ රු.4,800 ක් වැයකර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයක අයවැයගත සීමාවන් ඉක්මවා රු.3,324,463 ක වියදම් දරා තිබුණු අතර, එම වටිනාකම සියයට 21 විය. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ආ) | අරමුණුගත කාර්යය සඳහා යොදවා නොගැනීම නිසා එක් වැය විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ඇ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු.4,097,825 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එය සියයට 32 සිට 71 අතර පරාසයක විය. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක ගත වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අළුතින් කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීමෙන් පසු සුදුසු නිලධාරියෙකු පත්කර අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නියමිත පරිදි කමිටු පැවැත්වීමට පියවර ගනිමි. |